**<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ලේකම් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ලේකම් තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

- **සුදුසුකම් හා පළපුරුද්ද**

  i. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම
  ii. සේවා කාලය තුල කිසිදු විනය දඬුවමක් ලබා නොතිබීම හා නොනිමි විනය ක්‍රියාමාර්ග නොතිබීම
  iii. විශේෂ ශ්‍රේණියට පත්වීමෙන් පසු සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
  iv. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව, සුදුසුකම් පරීක්ෂා කරන දිනට පූර්වාසන්න වසර 05ක් තුල කාර්ය සාධන ඇගයීම සාමාන්‍ය මට්ටමේ හෝ ඉහළ මට්ටමක පැවතීම.

- **අයදුම්පත් ඉදිරිපත් කිරීම** - සුදුසුකම් හා සේවා පළපුරුද්ද ඇතුලත් කර තමන් විසින් සකස් කර ගත් ජීව දත්ත පත්‍රිකාවක් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය- **2023.08.25**

  **සභාපති**
  **රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
  **අංක 1200/9, රජමල්වත්ත පාර,**
  **බත්තරමුල්ල.**

- අයදුම්පත් ඉදිරිපත් කරන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ලේකම් තනතුර සඳහා අයදුම්පත" ලෙස සඳහන් කළ යුතුය.
- මෙම පත්කිරීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසානාත්මක තීරණය වේ.

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අංක 1200/9, රජමල්වත්ත පාර

බත්තරමුල්ල.